ශීර්ෂය 316 - වයඹ පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2018 වර්ෂය

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සෞභාග්‍යමත් වයඹ ජනතාවක්

### 1.2 මෙහෙවර

වයඹ ජනතාවගේ ජීවන තත්ත්වය සුඛිත මුදිත කිරීමට හැකිවන පරිදි මානව, භෞතික හා මූල්‍ය සම්පත් ඵල ප්‍රයෝජනයක් සහිත කාර්යයන් හි යෙදවීම සඳහා පරිපාලනයට නායකත්වය දීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම.

## 2. විසර්ජන ගිණුම

### මුළු ප්‍රතිපාදනය හා වියදම

වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 25,709.31 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 24,662.18 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 1,047.13 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.07 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2018 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 22,463.38 | 22,463.38 | - | - |
| මූලධන | 3,245.93 | 2,198.80 | 1,047.13 | 32.26 |
| එකතුව | 25,709.31 | 24,662.18 | 1,047.13 | 4.07 |

## 3. විගණන නිරීක්ෂණ

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.